වසන්තා විජේවර්ධන- පර්ත්

# සිහින පාරමී

නිදි කුමරිගෙ ගත වෙලා
සැප නින්දට පිවිසිලා
සිහින වැලක පැටලිලා
එක එක සිත්තම් බලා

නියගෙක සළකුණු පෙනේ
සැම තැන ළිං වියළුණේ
වතුර පොදක් නැති වුණේ
සැම දෙන දුක තනි කළේ

නොගැඹුරු වැව් ඇති ගමේ
නියගෙට මඩ ඉරි තැලේ
හිස් කල ගෙන දුර ඉමේ
සැම දෙන පිය මං කළේ

සමහර ළිං අඩි පතුලේ
වතුර බිඳක් දිලිසුණේ
ගිය අය සැම ඒ රැළේ
ගත් ජලයත් බොර අනේ

ලස්සන නිල් දිය කඳේ
ගැඹුරු වුණත් බිය නැතේ
දුර ගිය විට හමු වුණේ
මට පමණයි පුදුමැ කේ

කැඳවා සැම වට කර
සිටිනා කල මා බැස
නිල් දිය ඇද නැති බොර
බෙදුවා හිත සම කර

දුක් වූ අය සැම වෙතේ
සතුටක් නෙත ඉතිරුණේ
පිහිට වුණේ මගෙ සිතේ
සැමටම බැඳි සෙනෙහසේ



ශ්‍රියානි පෙරේරා
සවුත්බෑන්ක්

# නෑදෑයින්ගේ අසනීප වාර්තාව

ඉතින් පොඩි අක්කේ
කොහොමද දැන් ලොකු පුතාට?
කොහෙන් හදා ගත්තද ඔය
ජරා ලෙඩේ සෙංගමාල?

කිව්ව නහන ඔය ළමයා
කඩවලින් කෑම කනකොට
ටිකක් හිතන්නට එපාද
මෙහෙව් දෙයක් විය හැකි බව.

පරිස්සම් වෙන්න අක්කේ
දන්නවානෙ බෝ වෙන බව.
මගෙ හිතටත් හරිම දුකයි
නෑදෑයින් ලෙඩ වෙනකොට.

මෙහෙ තොරතුරු නං මොනවද
මේ දින වල හරි ජරමර.
ඔහේ යුද්දෙ මොන ටොයිස්ද
මෙහේ ප්‍රශ්න දකිනා විට?

පත්තරයක් අර ගත්තත්
රූපවාහිනිය බැලුවත්
ඇමතිවරු හිටන් ගෙන්නා
ඉක්මන් විසඳුම් ඉල්ලන.

මුළු රටමත් අඬා වැටෙයි
සිද්දවෙච්ච වින්නැහියට.
අස්සයින්ට උණ ගැනිලා




ධර්ම කේ. කොඩිප්පිලි

# යහනේ මල් පරවුණු දා

දේදුන්නේ පාට රැගෙන නේක පුෂ්පයෙන්
දෙඩුවා ඔබ සකසන බව ආදරේ යහන්
මල් යහනේ සතපන්නට දිවියෙ මතූ ඉතින්
සදාතනික ප්‍රේමයකට ඔබේ ඇරයුමින්

පුංචි ගෙපැල හැර යනකොට කඳුලක් හෙළුවට
ඔබේ සෙවන, ඔබේ තූරුල හසරැල්ලකි මට
දෙමාපියන් නෑ මිතූරන් පැතූමන් නැතිවට
දෙව්ලොව දොර හැර තියාවි මගෙ රන්කඳ මට

දේදුනු පාටින් ගතවුණු පුංචි කාලයෙන්
යහනේ මල් දැනුනා මට පරවී යන ලෙසින්
මන්දාරම් වැහිවලාව වැසූ ඔබෙ වතින්
මගේ වරද පමණක්ම ද, කී නිහඬ බසින්

අම්ල අචල මගෙ පෙම් ලොව කූමරුනි සැමදා
වෙන යහනක් පැතූවේ නැහැ මගේ ගත සදා
දුදනෙකූ වුව, ඔබ දෙවියන් වෙස් ගත්ත එදා
ඇරයුම් කලෙම් පෙම් කිරුලට නිමල ගත පුදා

විමසම් මම නෙත කඳුළින් බර වුව සුහදේ
මධු සමයේ මිහිර නැතිද, සෙනෙහස සින්දේ
පතනුයෙ කන්‍යාවියකගෙ සුව නම් ලමැදේ
ඇයි මිහිරිම දිනේට පෙර හුරුවක් වින්දේ

ප්‍රියංකා ගුණසේකර

# තනිකමේ නිමාවක්

බලන බලන අත
අඳුරු මූසල පාළුව
දරන්නට තවත් බැහැ
තනිකමේ බර මට

මේ ගිම්හානයේ
අලස ලෙස ගලන
මගෙ පාළු විජිතයේ
මිණි පහන දල්වන්න

පෙම්බරියෙ කොඳුරන්න
ඉසව්ව ඔබ වෙසෙන
ළඟ එන වසන්තේ
හද මල් පුබුදන්න

# පහන් වැට

සංස්කරණය
තුෂාරී ප්‍රියංගිකා

විජයසිරි තිලකුමාර
බ්‍රිස්බේන්

# තනිකම

සුවහසක් දන අතර
හඬ නගා සිනාසෙන
හිඳින මම තැවෙමි තව
තනිකමෙන්, පාලුවෙන් .

මා සිතන පතන යුරු
නොදැන, දැක මතුපිටින්
මා සමග උරණවන
කෙනෙකු දෙස බලමි මම.

මා මුහුණ මඟ හරින
මා තුලෙහි බිය දකින
කෙනෙකු හට කල දිනක
වරද කිම මම නොදැන.

ලොවට සරිලන පරිදි
මගේ ගති සලන ලෙද
මට බණන උවදෙසක්
හැර නැතිද විසඳුමක්.

මගේ හද වරද මිස
ගුණ දුටුව ප්‍රාණියෙක්
නැත දසත කිසි තැනෙක
ඉපිද මේ වන තුරා.

මා හැඟුම් හද තවන
කිසිවකුට හුරු නොවුන
අඳුරු හද කුටිය තුල
සිර කරමි සදහටම.

නදීකා ද සිල්වා

# අම්මේ

මුළු නිවස පාළුවී
නිහඬ බව රජ වෙලා
අම්මේ ඔබෙ සෙනෙහෙ
කොහේදෝ සැඟවිලා

ඔබෙ රුව සැගවුණත්
ගුණ සුවඳ පැතිරිලා
ඔබ මුවින් දුන් ඔවා
පිලිපදිමි සැමදා

මේ හවේ ඔබ අපෙන්
නික්ම ගොස් දෙවසරක්
ගෙවී ඇති නමුත්
මතු භවෙත්
මගේ මව් වන්නට
පැතුම් පතන්නෙමි මා

සඳ දිය ලවන්ලු
එකුදු විහඟකු නැත්
කොතරම් ඉහළ
ආකහේ සැරිසරත්

ඊ. ඒ. ඩෝසන් ප්‍රීති



# නිහාල් රූපසිංහ

# ළදරු සන්තෝෂම් දීමනාවේ වැරදි අතුරු ඵල

**Negative side effects of Australian 'baby bonus'**

නොදරු නිදන නෙරූ කුසැති
රුදුරු මතෙහි ගැලී පෙළෙන
වියරු ළඳුනෙ රුසිරු මැකෙන
අඳුරු කොණේ වීදියේ සරන

බමන මතින් අමතකව බිළිඳා කුස ඔත්
කවුරු සොයන් වේලාවේලා නොම දැන
අවුළු හිසින් නොසියුම් ගමනින්
දකින කවුරු හඳින් නාඩනා

ආත්මයට පුරන් අරමුණු තුරන්
පැටියා රන් ලැබ දුන් සුරන්
කෙලෙසා ලබන ළදරු සන්තෝෂම්
ලොබවද පිළිසින්දේ දරු සොචචම්

සෙනෙහසේ ගඟුල් ගලන
කෙම්බිමක් වුවමනා
ඔබේ මුදු කුස
රත් විස මත් උරා
ගිණි පිඹිනා යකිණිය
මරු විකල් වූ හිතට සිය වී නතු
කොයි අපායෙක යේද නැගණිය
අපොයි නුඹ මරණින් මතු..?

කියවන්න... ලියන්න...
තොරතුරු දැන ගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත්
කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.